# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/10 - 2016 සැප්තැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2016.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1837/8 හා 2013.11.19 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 6.2.2, 6.2.3.2. ii, 6.2.3.3 V හා 6.2.4.3 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2016 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 10,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දී ය.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව**

**6.2.2**

වාර්ෂික පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% ක් විද්‍යාවේදී (හෙද) උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන මාස 06 ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගනු ලැබේ.

**6.2.3.2.ii**

උස අඩි 4 අඟල් 10 ට නොඅඩු විය යුතුය. විද්‍යාවේදී (හෙද) උපාධිය මත හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගන්නා උපාධිධාරීන් සඳහා මෙම විධිවිධානය අදාළ නොවේ.

**6.2.3.3 v**

බඳවා ගැනීමේ සංඛ්‍යාවෙන් 5% ක් පුරුෂ පක්ෂය සඳහා වේ. එසේ වුව ද සේවා අවශ්‍යතාව මත පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීමේ ප්‍රතිශතය 5% උපරිමයකට යටත්ව කලින් කලට වෙනස් කරනු ලැබිය හැකිය. කෙසේ වෙතත් හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගන්නා විද්‍යාවේදී (හෙද) උපාධිධාරීන් සඳහා මෙම විධිවිධානය අදාළ නොවේ.


1A - G 24262 — 08 (2016/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**6.2.4.3 විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීම**

අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන හෙද උපාධිධාරීන් උපාධිය බලපැවැත්වෙන දිනය හා G.P.A අගය පදනම් කරගෙන පහත පරිදි සකස් කරනු ලබන කුසලතා ලේඛනයකට අනුව ශ්‍රී ලංකා හෙද සේවයේ 111 ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරෙහි පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

A. එකම විශ්වවිද්‍යාලයක කණ්ඩායමක් සඳහා පත්වීම් ලබා දීමේදී විශ්වවිද්‍යාලය මගින් ලබා දෙනු ලබන G.P.A අගය මත පදනම්ව කුසලතා ලේඛනය සකස් කරනු ලැබේ.

B. එකම විශ්වවිද්‍යාලයක කණ්ඩායම් 02 ක් සඳහා හෝ විවිධ විශ්වවිද්‍යාල වලින් උපාධිය ලබාගත් උපාධිධාරීන් සඳහා උපාධිය බලපැවැත්වෙන දිනය හා G.P.A අගය මත පදනම් කර ගනිමින් කුසලතා ලේඛනය සකස් කරනු ලැබේ.

10 - 210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.